<u>සාර්නියා දමිළ විද්‍යාලය-කන්දෙගෙදර</u>

"මිතුරු තෙමෝ දුක සැප දෙකෙහිම පවතී"

2009 වර්ෂයේ පෙබරවාරි මස 26 වන දින බදුල්ල ඌව මහ විද්‍යාලයෙහි ප්‍රධාන පුහුණුකරුවන් සඳහා වන ගුරු පුහුණුවක් ආරම්භ විය. මෙයට පාසල් නවයකින්ම ගුරුවරුන් පැමිණි අතර ඈත පාසල් වලින් පැමිණි ගුරුවරුන් කිහිප දෙනෙකුද මේ අතර විය.

මේ අතර සිටි අරුලානන්දන් නැමැති දමිළ ගුරු මහතා කන්දෙගෙදර නැමැති ගම්මානයෙහි ඇති සාර්නියා නැමැති තේ වතුයායෙහි ඇති සාර්නියා දමිළ විද්‍යාලයෙහි ඉංග්‍රීසි විෂය උගන්වන ගුරු මහතෙකි. ඔහු ප්‍රධාන පුහුණුව පැවති දින අටම නොකඩවා පැමිණ එම පුහුණුව සාර්ථකව නිම කළේය.

එම ප්‍රධාන පුහුණුවෙන් සතියකට පමණ පසු ඔහුව ඇමතීමට ගත් උත්සාහයේදී ඔහුගේ දුරකථනය ක්‍රියාත්මක නොවිනි.පාසලෙහි දුරකථන අංකයට කථා කිරීමට ගත් උත්සාහයද අසාර්ථක විය. අවසානයේ දී කල හැකි එකම දෙය වූයේ පාසලට යෑමය.

පාසලට යාමට තිබූ මාර්ගය වූයේ බදුල්ල නගරයට අසල ඇති හාලිඇල නම් කුඩා නගරයෙන් ඇති අතුරු මාර්ගයක් ඔස්සේය. එම අතුරු මාර්ගය කොතරම් දුෂ්කරද කිවහොත් පෞද්කලික වාහනයකින් යාමට ම පැය දෙකක් පමණ ගත වුනි.

අවසානයේදී Intel ගුරු පුහුණු කන්ඩායමේ සාමාජිකයින් පාසලට පැමිණි අතර මුලින්ම හමු වූයේ පාසලේ විදුහල්පති තුමාය.ඔහුගේ පාසලට පැමිණීම ගැන ඔහු ඉතාමත් සන්තෝශ විය. පසුව ඔහුගෙන් අරුලානන්දන් මහතා ගැන විමසූ විට ඔහු පැවසූයේ එම ගුරු මහතා හට වෙනත් පුහුණුවක් සඳහා ඉන්දියාවට යාමට සිදුවූ බවයි.

ඔහුට ඉන්දියාවට යාමට පෙර පාසලේ සිටින ගුරුවරුන් පුහුණු කිරීමට නොහැකි විය. නමුත් ඔහු ඊට ඉතා කදිම පිළියමක් යොදා තිබුනි. ඒ ප්‍රභාහාරන් නැමැති තම සහෝදර ගුරු මහතාව හොඳින් පුහුණු කිරීමයි. ඔහුගේ අදහස වූයේ ප්‍රභාහරන් ගුරු මහතා ලවා ඉන්ටෙල් ගුරු පුහුණුව තම පාසලේ

අරුලානන්දන් මහතා

ගුරුවරුන් හට ලබා දීමයි. ඊට පසු අරුලානන්දන් මහතා ඉන්දියාවට ගොස් තිබුණි. ප්‍රභාහරන් මහතාද තමන්ට හැකි අයුරින් එම කාර්යය ඉටු කිරීමට අසල්වැසි පාසල් වල තම මිතුරන් ගෙන්ද සහය ඉල්ලා තිබූ අතර, පුහුණුව ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සියල්ලම සංවිධානය කර තිබුනි.

ප්‍රභාහරන් මහතා ද තරුණ, දක්ෂ ඉතා කාර්යශූර ගුරුවරයෙකු විය. ඔහු Intel ගුරු පුහුණු කන්ඩායමේද සහය ඇතිව පාසලේ සිටින ගුරුවරුන් දා හත් දෙනෙකු පළමු කණ්ඩායම තුලින් පුහුණු කරණ ලදී. මෙහිදි පරිගණක භාවිතයට මෙන්ම අන්තර්ජාලය පරිහරනයට ද සිය ගුරුවරුන් යොමුවන අයුරු දුටු විදුහල්පතිතුමා මවිතවිය.

ඊට මාස දෙකකට පමන පසුව අරුලානන්දන් මහතා නැවතත් තම පාසල වෙත පැමිණියේය. ඒ වන විට අරුලානන්දන් මහතාට දක්නට ලැබුනේ එයට මාස දෙකකට පෙර ඔහු ඉන්දියාව බලා යන විට තිබූ පාසල නොවේ. Intel පුහුණුවෙන් පසුව පාසල් පරිගණක ඒකකය හුදකලා ඒකකයක් බවට පත් නොකර ළමුන්ව පන්ති කාමරයෙන් පරිසණක මධ්‍යස්ථානය වෙත රැගෙන ගොස් විවිධ පාඩම් සිදු කර ගැනීමට ගුරුවරුන් පෙලඹී ඇති අතර පාසල් අධ්‍යාපන අභිමතාර්ථ සාධනය කර ගැනීමෙහිලා වැදගත් දායකත්වයක් ඉටු කරන අංශයක් බවට පරිගණක ඒකකය පත්විය. එමෙන්ම වෙනදාට පාසලේ පරිසණක මධ්‍යස්ථානයට වැඩිය නොපැමිණි ගුරුවරුන් එය භාවිතයට ගැනීමට පටන් ගත් අතර ගුරුවරුන් පාඩම් සඳහා අවශ්‍යය බහුමාධ්‍ය ඉදිරිපත්කිරීම් තනිවම සකස් කර ගැනීමට පෙලඹී තිබේ. පසුව එම ගුරු මහතුන් දෙදෙනාම එක්ව තවත් ගුරුවරුන් විසි දෙනෙකුගෙන් සැදුම්ලත් කණ්ඩායමක් පුහුණු කිරීමට ආරම්භ කළේය. මේ සියල්ලකටම විදුහලපතිතුමාගේ සහය නොඅඩුව ලැබුණි.

මේ ආකාරයට තම වගකීම් හැකි උපරිම අයුරින් ඉටු කිරීමට උත්සහ දරන අරුලානන්දන් මහතා වැනි ගුරුවරුන් ද, තම කාර්යයක් නොවුනත් සියළු වගකීම් කරටගෙන කැපවීමෙන් වැඩකරන ප්‍රභාහරන් මහතා වැනි ගුරුවරුනුත් කරන්නාවූ මෙම සේවය අගය කල යුතුමය. මෙය එම දෙපලට උපහාරයකි. අඩු පහසුකම් ඇති පාසලකට ද මෙවැනි දෙයක් කල හැකි නම් අනෙකුත් පාසල් වලට කොතෙක් දේවල් කල හැකිද?

ඒ. අරුලානන්දන් මහතා

සාර්නියා දමිළ විද්‍යාලය

කන්දෙගෙදර